www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# විරෝධතා ලිපි ශ්‍රී ලංකාවේ සසප ආධාරකරුවා ඝාතනය කිරීම ගැන පරීක්ෂනයක් ඉල්ලයි

## Letters demand inquiry into murder of SEP supporter in Sri Lanka

**2006 සැප්තැම්බර් 12**

සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවකු වූ සිවප්‍රගාශම් මරියදාස් ඝාතනය පිලිබඳව පූර්න පරීක්ෂනයක් ඉල්ලා ශ්‍රී ලංකාවේ බලධාරින් වෙත යවන ලද ලිපි ගනනාවක පිටපත් ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත දැනටමත් ලැබී ඇත.

මරියදාස් ඝාතනය කරන ලද්දේ, අගෝස්තු 7 දා රාත්‍රියේ, ත්‍රිකුනාමලය නම් වූ නැගෙනහිර පලාතේ වරාය නගරයේ සිට කිලෝ මීටර් 20ක් දුරින් පිහිටි මුල්ලිපොතන නම් ගම්බද නගරයේ පිහිටි සිය නිවසේ දී ය. රාත්‍රි 9.30ට පමන කිසිවකු දෙමල බසින් ඔහුගේ නම කියා අමතනු ඇසී ඔහු නිවසේ දොර දෙසට ගියේ ය. තුවක්කුකරුවෙක් ඔහුගේ නලලට හා බෙල්ලට වෙඩි තබා එලියේ බලා සිටි යතුරු පැදියක නැගී පලා ගියේ ය. මරියදාස් ක්ෂනිකව මිය ගියේ ය.

ඝාතකයන් වීමට බොහෝ සෙයින් ඉඩ ඇත්තේ ශ්‍රී ලංකාවේ මිලිටරිය හෝ එය සමග සහයෝගීව ක්‍රියාත්මක වන දෙමල පැරා-මිලිටරි කන්ඩායම් ය. මරියදාස් ඝාතනය කරන ලද්දේ යාබද මුතූර් හා මාවිල්ආරු ප්‍රදේශවල දී හමුදාව සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර දරුනු සටන් පැවතීමෙන් අනතුරුව ය. ආරක්ෂක හමුදාවන් මුල්ලිපොතනෙහි දැඩි මුර සංචාරයන් පවත්වා ගෙන ගිය අතර එබැවින් රාත්‍රියේ දී නගරය තුල කිසිවකුට ඔවුනට හසු නොවී ගමන් කිරීම අසීරු විය.

එපමනක් නොව, ඝාතනයෙන් ඉක්බිතිව, මිලිටරිය, ඔහුගේ ගම වන සෙල්වනායගපුරම්හි ඔහුගේ අවමගුල පැවති අවස්ථාවත් ඇතුලුව, මරියදාස් එල්ටීටීඊ ආධාරකරුවකු බවට හිතාමතාම කටකතා පතුරුවා හැරියේ ය. සිවිල් යුද්ධය යලි ඇවිලවීමේ ආන්ඩුවේ පියවරයන්ට විරුද්ධත්වය දක්වන ඕනෑ ම අයකු බිය වැද්දීම් හා නිහඬ කිරීමේ එල්ලයෙන් විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පලාත්වල මිලිටරිය ගෙන යන වඩා පුලුල් ව්‍යාපාරයක කොටසකි මරියදාස්ගේ ඝාතනය.

පසු ගිය මාස දහයක කාලය මුලුල්ලේ, පාර්ලිමේන්තු සභිකයන් හා මාධ්‍යවේදීන් ද ඇතුලු කොලඹ හා උතුරු-නැගෙනිහර දෙමල ජනයාට එරෙහි ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න කෙරී ඇත. මිලිටරියේ හෝ පැරා-මිලිටරි කන්ඩායම්වල කොටස් සම්බන්ධ බවට සැක කෙරුනු මෙවන් එකදු සිද්ධියක දී වත් බැරෑරුම් පොලිස් පරීක්ෂනයක් සිදු කොට නැත. මෑත ම අපරාධය නම් මරියදාස් ඝාතනය කිරීමට යන්තම් දින කිහිපයකට පෙර මුතූර්හි දී ප්‍රන්ස-පාදක ඇක්ෂන් කොන්ට්‍ර ල ෆාම් (ඒසීඑෆ්) සංවිධානයේ ප්‍රාදේශීය සහන සේවකයන් 17 දෙනකු ඝාතනය කිරීම යි.

සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්, "ශ්‍රී ලංකාවේ සසප සිවප්‍රගාශම් මරියදාස් ඝාතනය පිලිබඳ පූර්න පරීක්ෂනයක් ඉල්ලයි" යන මැයෙන් යුත් සසප ප්‍රකාශයේ පිටපතක් සහිතව ශ්‍රී ලංකාවේ මාධ්‍ය වෙත පසු ගිය සතියේ ලිපියක් යැවී ය. දිනපතා ඉංග්‍රීසි පුවත්පතක් වන අයිලන්ඩ් පත්‍රය පසු ගිය සෙනසුරාදා, විධිමත් පරීක්ෂනයක් පිලිබඳ සසප ඉල්ලීම ගැන සිය 2 වන පිටුවේ ප්‍රමුඛ ලිපියක් පල කලේ ය. පුලුල් පාඨකත්වයක් සහිත දෙමල පුවත්පතක් වන තිනකුරල් ඊයේ සසප ප්‍රකාශය මුලුමනින් ම පල කලේ ය.

මරියදාස් ඝාතනය ගැන පූර්න පරීක්ෂනයක් ඉල්ලා ශ්‍රී ලංකාවේ බලධාරින් වෙත විරෝධතා ලිපි යැවීම මගින් මෙම උද්ඝෝෂනයට සහයෝගය දෙන ලෙස අපි අපගේ පාඨකයන්ගෙන් හා ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටිමු.

විරෝධතා ලිපි යැවිය යුත්තේ මේ ලිපිනයන්ට යි:

පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු,
පොලිස් මූලස්ථානය, කොලඹ 01, ශ්‍රී ලංකාව.
ෆැක්ස් අංකය: 0094 11 2446174
ඊ-මේල්: igp@police.lk

නීතිපති කේ.සී. කමලසබේසන්,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොලඹ 12, ශ්‍රී ලංකාව.
ෆැක්ස් අංකය: 0094 11 2436421

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය හා ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත ද එම විරෝධතා ලිපිවල පිටපත් එවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ. 1270,
කොලඹ, ශ්‍රී ලංකාව.
ඊ-මේල්: wswscmb@sltnet.lk

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩලය වෙත ලිපි යැවීම පිනිස මෙය භාවිත කරන්න:* online form

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත ලැබුනු ශ්‍රී ලංකාවේ බලධාරීන්ට යොමු කෙරුනු ලිපිවලින් කොටසක් අපි පහත පල කරමු.*

* * *

ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ සමාජ සමානතාව සඳහා වූ ශිෂ්‍ය සංවිධානය වෙනුවෙන්, මා ඔබට ලියන්නේ, සිවප්‍රගාශම් මරියදාස්ගේ ඝාතනය සම්බන්ධයෙන් නොපමාව පරීක්ෂනයක් අරඹන ලෙස ඔබෙන් ඉල්ලා සිටීමට යි.

අගෝස්තු 7 දා නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ දී මරියදාස් ඝාතනය කරන ලදි. ඔහුගේ ඝාතනය දේශපාලනිකව මෙහෙයවුනු ඝාතනයක සියලු ලක්ෂන දැරූ අතර, එපමනක් නොව, එය අඩු ගනනේ ආරක්ෂක හමුදාවල වක්‍ර සහයෝගය ලද අපරාධයක් බව පෙනී යයි.

මා ඔබට සහතික ලෙස කියා සිටින්නේ, ජාත්‍යන්තර ශ්‍රාවකත්වය මෙම සිද්ධිය දෙස උපරිම උනන්දුවකින් බලා සිටින බව යි.

ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ සිසුන් වන අප ඉල්ලා සිටින්නේ, නොපමාව පරීක්ෂනයක් ඇරඹීම මගින් ඔබගේ රාජකාරිය ඉටු කරන ලෙස යි.

ටොම් මැකමන්
සභාපති, සමාජ සමානතාව සඳහා වූ ශිෂ්‍ය සංවිධානය, ඉලිනොයිස් විශ්වවිද්‍යාලය, උර්බානා-ෂැම්පේන්, ඉලිනොයිස්, ඇමරිකා එක්සත් ජනපදය.

* * *

ත්‍රිකුනාමලයේ මුල්ලිපොතනහි දී 2006 අගෝස්තු 7 දා සිවප්‍රගාශම් මරියදාස් ඝාතනය කිරීම ගැන දැනගැනීමෙන් මම මහත් කම්පනයටත් දුකටත් පත් වීමි. මා ඔහුගේ ක්‍රියාකාරකම් ගැන දන්නේ, කුමන මූලාශ්‍රයකින් සිදු කලත්, දෙමල, සිංහල හා මුස්ලිම් ජනයාට එරෙහි සියලු ප්‍රචන්ඩ ක්‍රියාවන්ට එරෙහිව විවෘතව උද්ඝෝෂනය කර ඇති අයකු ලෙස ය.

මරියදාස්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම හා සිය ස්ථිරසාර සමාජවාදී ආස්ථානය සම්බන්ධයෙන් ලොව පුරා ප්‍රසිද්ධ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවෙක් විය. මෙම අපරාධය සම්බන්ධයෙන් බැරෑරුම් හා විධිමත් පරීක්ෂනයක් පවත්වා අපරාධකරුවන් නීතිය හමුවට පමුනුවන ලෙස මම බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමි.

එම්.ජී.ඒ. කුරේ,
ජාත්‍යන්තර සබඳතා පිලිබඳ මහාචාර්ය, කොලඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

* * *

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය තම ආධාරකරුවකු වන සිවප්‍රගාසම් මරියදාස් අගෝස්තු 07 වන දින ඔහුගේ නිවසේදී වෙඩි තබා ඝාතනය කර ඇති බව දන්වා ඇත.

මහ බැංකු සේවක සංගමයේ සභාපති ලෙස එම ඝාතනය තරයේ හෙලා දකින අතර දැඩි සේ විරෝධය ප්‍රකාශ කරමි.

මෙම ඝාතනය ශ්‍රී ලංකාවේ මිලිටරියේ, පොලිසියේ හෝ ඔවුන් සමග එක්ව කටයුතු කරන අර්ධ-මිලිටරි කන්ඩායම්වල සාමාජිකයින් විසින් සිදු කරන්නට ඇති බව සමාජවාදී සමානතා පක්ෂය හා ලෝක සමාජවාදී වෙබ් අඩවිය සඳහන් කරයි. මෙම කරුනු විමසා බලන විට එම සැකය සාධාරන බව මම ද පිලිගනිමි.

එමෙන්ම ශ්‍රී ලංකාව තුල වර්තමානයේ සිදු කරන පැහැරගෙන යාම්, ඝාතනය කිරීම්, මාධ්‍යවේදීන්ට එල්ල කරන තර්ජනයන් සහ වැඩ කරන ජනතාවන්ට එල්ල කරන මර්දනයන් දැඩි ලෙස සැලකිල්ලට ගන්නා මහ බැංකු සේවක සංගමය ඒවාට තරයේ විරෝධය දක්වයි.

අගෝස්තු 07 දින සිදු කරන ලද ඉහත සඳහන් ඝාතනය පිලිබඳ තඹලගමුව පොලීසියේ අපරාධ අංශයේ වැඩ බලන ප්‍රධානියා පවසා ඇත්තේ පරීක්ෂකයින්ට ඝාතනය පිලිබඳ හෝඩුවාවක් සපයා ගැනීමට නොහැකි වූ බවයි. මෙයින් පෙනීයන්නේ අපරාධකරුවන් අත් අඩංගුවට ගැනීම වැලකීම හා අපරාධය යට ගැසීමක් සිදු වන බවයි.

මහ බැංකු සේවක සංගමයේ සභාපති ලෙස එයට දැඩි ලෙස විරුද්ධ වන අතර ඝාතනය පිලිබඳ පූර්න පරීක්ෂනයක් පවත්වා අපරාධකරුවන් අධිකරනයට පමුනුවන ලෙස ඉල්ලා සිටිමි.

එම්. ජී. කිරිබංඩා
සභාපති, මහ බැංකු සේවක සංගමය, ශ්‍රී ලංකාව.

* * *

පසු ගිය අගෝස්තු 7 වන දා ත්‍රිකුනාමලය දිස්ත්‍රික්කයේ මුල්ලිපොතනහි දී සමාජවාදී සමානතා පක්ෂයයේ :සසප* ආධාරකරුවෙකු වන සිවප්‍රගාසම් මරියදාස් වෙඩි තබා ඝාතනය කිරීම මම තරයේ හෙලා දකිමි.

සසප ආධාරකරුවෙකු වශයෙන් සිටිමින්, පවත්නා යුද්ධය සම්බන්ධයෙන් කම්කරු පන්තික ස්ථාවරයක සිට ක්‍රියා කල සමාජ ක්‍රියාකාරිකයෙකු ලෙස මම මරියදාස් දකිමි. මරියදාස්ගේ මරනයට ප්‍රධාන හේතුව වන්නේ ඔහු යුද්ධයට එරෙහිව තම මතය ප්‍රසිද්ධියේ දැරීමයි.

සසප එදා සිට අද දක්වා යුද්ධය සම්බන්ධයෙන් දැරූ මතය කොලඹ ධනපති පන්තිය ද එමෙන්ම එල්ටීටීඊ බෙදුම්වාදීන් ද දැරූ මතය නොවේ. සසප යනු "උතුරෙන් සහ නැගෙනහිරෙන් හමුදාව ඉවත් කරනු" යන ඉල්ලීම යටතේ සිංහල සහ දෙමල කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම සඳහා සටන් වදින ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයයි. මරියදාස් පිලිගත්තේත් නියෝජනය කලේත් එම දේශපාලනයයි.

කොලඹ පාලක පන්තීන් විසින් සමස්ත දිවයිනම මිලිටරිකරනය කිරීම සඳහා ගෙනයන වැඩ පිලිවෙලේදී යුද්ධයට එරෙහි මතවාදයන් දරන සියලු ක්‍රියාකාරීන් බියවද්දා නිහඬ කිරීම මෙම ඝාතනයේ අරමුනයි.

මෙම ඝාතනය සම්බන්ධයෙන් පූර්න පරීක්ෂනයක් පවත්වා ඝාතනයට වග කිවයුත්තන් අධිකරනය ඉදිරියට පමුනුවා ඔවුනට දඬුවම් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

ධර්මසිරි බන්ඩාරනායක
ශ්‍රී ලංකාව.

(බන්ඩාරනායක ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ චිත්‍රපට හා නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකි.)

* * *

මා මෙය ලියන්නේ, නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ දී 2006 අගෝස්තු 7 දා රාත්‍රියේ දී මරියදාස් සිවප්‍රගාශම් ඝාතනය කිරීම ගැන පොලීසිය පූර්න පරීක්ෂනයක් පවත්වන ලෙස ඉල්ලා සිටීමට යි.

මෙම ඝාතනය සිදු වූයේ, ඒ අවස්ථාවේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවන් විසින් වාඩිලා ගෙන හා දැඩි ලෙස මුර සංචාරයන්හි යෙදී සිටි යුද කලාපයක් තුල ය. ඝාතකයා යතුරු පැදියකින් පලා ගිය අතර අඩු ගනනේ ප්‍රදේශය පුරා පිහිටුවා ඇති ආරක්ෂක සෝදිසි ස්ථානවලින් එකක් හරහා වත් යා යුතුව තිබුනි. එබැවින්, මෙය එල්ටීටීඊයේ හෝ එහි ආධාරකරුවකුගේ වැඩක් යන උපකල්පනය කිසි සේත් වලංගු නැත.

මේ වන තෙක් පරීක්ෂනය සිදු කර ඇති ආකාරය ගැන බලගතු ලෙස විරෝධය දක්වන මම, අපරාධය සඳහා වගකිව යුත්තන් යුක්තිය හමුවට පමුනුවන ලෙස ඉල්ලා සිටිමි. මෙම දරුනු අපරාධය වත් ඒ ගැන ඔබ කරන පරීක්ෂනය වත් අමතක නොවනු ඇත. ලෝකයා ඒ දෙස බලා සිටී.

හර්මන් රොජර්ස්, (කනිෂ්ඨ)
ලාස් වේගාස්, එක්සත් ජනපදය

* * *

පක්ෂ ආධාරකරුවකු වන මරියදාස් සිවප්‍රගාශම් ඝාතනය පිලිබඳව පරීක්ෂනයක් ඉල්ලා සමාජවාදී සමානතා පක්ෂය ගෙන යන උද්ඝෝෂනයට මගේ බලගතු සහයෝගය ප්‍රකාශ කරමි. අගෝස්තු 7 දා රාත්‍රියේ දී, ත්‍රිකුනාමලය අසල මුල්ලිපොතන නම් නැගෙනහිර පලාතේ ගම්බද නගරයේ පිහිටි ඔහුගේ නිවසේ දී මරියදාස්ට වෙඩි තබා ඝාතනය කරන ලදි.

මහලිංගම් වේලු
යාපනය, ශ්‍රී ලංකාව.

* * *

ශ්‍රී ලංකාවේ කැලෑ නීතිය අවසන් කල යුතු ය. සිවප්‍රගාශම් මරියදාස්ගේ ඝාතකයන් කිසිදු සමාවකින් තොරව යුක්තිය ඉදිරියට පැමිනවිය යුතු ය. ඊනියා "ශ්‍රී ලංකාවේ නීතිය කරවන්නන්" ඝාතකයන් අල්ලා ගැනීමේ සිය ප්‍රයත්නයේ දී උනන්දු සහගත හා අවංක නම්, සත්‍යය සොයා ගැනීමට ඇති තරම් හෝඩුවාවන් පවතින බව පෙනී යයි. ඔවුන් ලග සිටිය දී සිය ආදරනීය සමීපතයන් ඝාතනය කිරීම අත්දැක ඇති දෙමව්පියන්ගේ, බිරිඳගේ හා දරුවන්ගේ හැඟීම් ඔබ තේරුම් ගත යුතු ය. ඔබට සඳහට ම ගැලවී යා හැකි යැයි ඔබ සිතා සිටින නමුදු, දිගු කලක් තිස්සේ යුක්තියෙන් ගැලවී සිටීමට ඔබ අපොහොසත් වනු ඇත. සුපිරි බලවතකු අපට ඉහලින් සිටින බව අමතක නොකරන්න.

සුන්දරී රාමලිංගම්

* * *

මා ඔබට ලියන්නේ, සිවප්‍රගාශම් මරියදාස්ගේ ඝාතනය සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිදු බැරෑරුම් පොලිස් පරීක්ෂනයක් නොමැති වීම ගැන මාගේ කෝපය ඔබට ප්‍රකාශ කිරීමට හා මෙම තත්වය වෙනස් කරන ලෙස ඉල්ලා සිටීමට යි. සිවප්‍රගාශම් මරියදාස් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ආධාරකරුවෙක් වූ අතර ඒ මගින් ශ්‍රී ලංකාවේ ආන්ඩුවේ යුද්ධයට එරෙහිව සිංහල, දෙමල හා මුස්ලිම් වැඩ කරන ජනතාව එකමුතු කිරීම වෙනුවෙන් පෙනී සිටීමට කැප වූ අයෙක් විය. ජාතික හා ජාත්‍යන්තර සමාගම් එක සේ සිංහල, දෙමල හා මුස්ලිම් වැඩ කරන ජනතාවගේ ලාභ ශ්‍රමයෙහි වාසිය ගන්නා අතරතුර කම්කරුවකුට එරෙහිව තවත් කම්කරුවකු පිහිටුවමින්, ගෙන යන බෙදා පාලනය කිරීමේ සිය න්‍යාය පත්‍රයට එය වල කපන බැවින්, ශ්‍රී ලංකාවේ ආන්ඩුව හා මිලිටරිය මෙම ඉදිරිදර්ශනයට කැමති නැත.

ඔහු ඉලක්ක කර ගැනුනේ ඔහුගේ සප්‍රතිපත්තික ආස්ථානය නිසා බවට සැකයක් නැත. ඔහු එල්ටීටීඊ සාමාජිකයකු බවට මිලිටරිය බොරු ප්‍රචාර පතුරුවා හැරීම ද එමෙන් ම පුදුමයට කරුනක් නොවේ. දෙමල ජනයාට එරෙහිව ආන්ඩුව ගෙන යන වර්ගවාදී යුද්ධයට ඔබ විරුද්ධ වුව හොත් ඔබ එල්ටීටීඊ සාමාජිකයකු විය යුතු බවට ද ඔබ ආන්ඩුවට විරුද්ධ වුව හොත් ඔබට සලකන්නේ මෙලෙස බවට ද එමගින් පලමු කොට ම යෝජනා කෙරෙයි. දෙවනුව එය ප්‍රයත්න දරන්නේ එල්ටීටීඊයේ ද්‍රෝහී හා අවෘත අන්තරයකට යොමු වූ ඉදිරිදර්ශනයට සංසන්දනාත්මකව සසපයේ සප්‍රතිපත්තික අරගලය පිලිබඳව වැඩ කරන ජනතාව තුල ව්‍යාකූලත්වයක් නිර්මානය කිරීමට යි.

අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ආධාරකරුවකු ලෙස, මා ඉල්ලා සිටින්නේ, මෙම සප්‍රතිපත්තික මිනිසා මරා දැමීමට සම්බන්ධ මිනීමරු මැරයන් සොයා ගෙන ඔවුන්ට නඩු පැවරීමෙහි ලා පූර්න පරිශ්‍රමයක් දැරිය යුතු බව යි.

ස්ටීව් පොලොක්,
මෙල්බෝර්න්, ඕස්ට්‍රේලියාව.

© www.wsws.org